# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 9 දරන
# දෘශ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල පනත

---

[සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 5 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 මාර්තු මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : ශත 60 යි.        තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1992 අංක 9 දරන දෘශ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල පනත

එල්.ඩී.-ඕ. 82/88

**දෘශ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදලක් පිහිටුවීම සඳහා ද එහි පරමාර්ථ හා බලතල නිශ්චය කොට දැක්වීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1992 අංක 9 දරන, දෘශ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (1) මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන, දෘශ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන භාර අරමුදලක් පිහිටුවනු ලැබේ. — දෘශ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදලක් පිහිටුවීම.

(2) අරමුදල, (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් සංස්ථාවක් වන අතර ඊට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇත්තේ ය. තව ද ඒ නාමයෙන් එය විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

3. (1) අරමුදලේ පරිපාලනය, කළමනාකරණය හා පාලනය මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති පරිදි සංස්ථාපනය කරනු ලබන කළමනාකරණ මණ්ඩලයක් වෙත පැවරෙන්නේ ය. — අරමුදලේ කළමනාකරණ මණ්ඩලය.

(2) මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන, අරමුදලේ කළමනාකරණ මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වන්නේ ය:—

(i) සමාජ සේවා, සමාජ ශුභ සාධන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ; ඔහු (මෙහි මින් මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන), මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ය.

(ii) ගරු ගලබොඩ ඥානිස්සර ස්වාමීන් වහන්සේ ; ඔහු මණ්ඩලයේ යාවජීව සාමාජිකයෙක් වන්නේ ය.

(iii) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු, තත් කාලයෙහි සමාජ සේවා අධ්‍යක්ෂ ධුරය දරන තැනැත්තා ;

(iv) සමාගම් පනත යටතේ සංස්ථාගත කර ඇති ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිත ජනතා සම්මේලනයේ සභාපති සහ ලේකම් ධුර තත් කාලයෙහි දරන තැනැත්තන් ;

(v) ශ්‍රී ලංකා අන්ධ ජීන සේවා මණ්ඩලයේ එක් නියෝජිතයෙක් ;

(vi) ශ්‍රී ලංකා ජාතික දෘශ්‍යාබාධිත සමිති සම්මේලනයේ නියෝජිතයෙක් ;

(vii) අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිත යෙක් ;

(viii) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ශ්‍රී ලංකා සිංහ සමාජයේ නියෝජිතයෙක්.

(3) අමාත්‍යවරයා විසින් කලින් ඉවත් කරනු ලැබුවහොත් මිස, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, කළමනාකරණ මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම අවුරුදු දෙකක කාලයක් ධුරය දැරිය යුතු ය.

(4) සභාපතිවරයා, මණ්ඩලයේ රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විට, පැමිණ සිටින සාමාජිකයන් අතුරෙන් තෝරා පත් කර ගනු ලබන යම් සාමාජිකයකු ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතු ය.

(5) මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස් දෙනෙකු විය යුතු ය.

(6) (5) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් මණ්ඩලයේ රැස්වීම් සම්බන්ධයෙන් සහ ඒ රැස්වීම්වල කටයුතු කිරීම සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය විධිමත් කරගත හැකි ය.

(7) මණ්ඩලයේ සාමාජිකත්වයෙහි පුරප්පාඩුවක් තිබීමේ හෝ සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් පමණක්, මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් නිර්බල ලෙස සලකනු නොලැබිය යුතු ය.

අරමුදලේ මුද්‍රාව.

4. අරමුදලේ මුද්‍රාව, මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලබන තැනැත්තන් භාරයේ තිබිය යුතු ය. මණ්ඩලයේ අනුමතය ඇතිව සහ මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට හෝ ලියවිල්ලකට මුද්‍රාව නොතැබිය යුතු ය. තව ද තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඔවුන් ඒ සාධන පත්‍රයෙහි හෝ ලියවිල්ලෙහි අත්සන් තැබිය යුතු ය.

අරමුදලේ අරමුණු.

5. අරමුදලේ පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු ය:—

(අ) දෘශ්‍යාබාධිතයන් සඳහා අධ්‍යාපනික සහ වෘත්තීය පුහුණු පහසුකම් සැපයීම ;

(ආ) දෘශ්‍යාබාධිතයන් සඳහා සේවානියුක්ති අවස්ථා ඇති කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී ඔවුන්ට ස්වයං රැකියා සඳහා මූල්‍යාධාර සහ මාර්ගෝපදේශකත්වය සැපයීම ;

(ඇ) දෘශ්‍යාබාධිතයන්ට ශාස්ත්‍රීය පාඨමාලා හැදෑරීමට හෝ වෘත්තීය පුහුණුව ලබා ගැනීමට හැකිවනු පිණිස ඔවුන්ට නිවාස පහසුකම් සැපයීම ;

(ඈ) දෘශ්‍යාබාධිතයන්ගේ සුභ සාධනය පිණිස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම ;

(ඉ) දෘශ්‍යාබාධිතයන් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සඳහා අලෙවි පහසුකම් සැපයීම ; සහ

(ඊ) සමාන අයිතිවාසිකම් සහ සමාන අවස්ථා ලබා ගැනීමෙන් දෘශ්‍යාබාධිත තැනැත්තන් වළක්වාලන තත්ත්වයන් නැති කිරීමට ක්‍රියා කිරීම.

6. (1) අරමුදලේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ උපකාරීවන හෝ ආනුෂංගික වන සියලු දේ අරමුදලේ නමින් කිරීමට මණ්ඩලයට බලය ඇත්තේ ය. — මණ්ඩලයේ බලතල සහ කාර්ය.

(2) (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, මෙහි පහත දක්වෙන බලතල හා කර්තව්‍ය මණ්ඩලය සතු වේ :—

(අ) යම් මිලදී ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාග වශයෙන්, රික්ථ වරණය මගින් හෝ අන්‍යාකාරයකින් මණ්ඩලය වෙත පැවරෙන චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීම සහ දැරීම ;

(ආ) එවැනි කවර හෝ දේපළක් විකිණීම, උකස් කිරීම, බදුදීම, ප්‍රදානය කිරීම, සමර්පණය කිරීම, රික්ථවරණය කිරීම, පැවරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ඇ) අරමුදල වෙත පැවරී ඇති, අරමුදල විසින් අත්කර ගන්නා හෝ දරනු ලබන කවර හෝ ඉඩමක යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම ;

(ඈ) අරමුදලට අයත් මුදල්, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සුරැකුම්පත්වල ආයෝජනය කිරීම ;

(ඉ) බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම වසා දැමීම සහ අරමුදලේ දේපළ ඇපයට තබා හෝ ඇපයක් නොමැතිව හෝ අරමුදලේ කාර්ය සඳහා මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම ;

(ඊ) අරමුදල් රැස් කිරීම සහ දේශීය හෝ විදේශීය ප්‍රභවයන් ගෙන් මුදලින් නැතහොත් ද්‍රව්‍යවලින් ප්‍රදාන, තෑගි හෝ පරිත්‍යාග ලබාගැනීම ; සහ

(උ) අරමුදලේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා ආනුෂංගික හෝ හිතකර වෙනත් සියලු ක්‍රියා සහ දේවල් කිරීම.

7. (අ) ලබා ගන්නා අරමුදල් හෝ, දේශීයව හෝ විදේශවලින් ලැබෙන ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග හෝ, උපලබ්ධ වන හෝ එකතු කරන මුදල් ; සහ — අරමුදලට ගෙවීම්.

(ආ) අරමුදලේ ආයෝජනවලින් ලැබෙන ආදායම හෝ අරමුදලට අයවිය යුතු වෙනත් මුදල්

අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

8. (අ) අරමුදල ක්‍රියාත්මක කිරීම, පිහිටුවීම හෝ පවත්වාගෙන යාම හා සම්බන්ධ වියදම් ; සහ — අරමුදලෙන් ගෙවීම්.

(ආ) අරමුදලේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය බවට මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වෙනත් සියලු ගෙවීම් හෝ අරමුදලින් ගෙවීමට මේ පනතින් බලය දී ඇති සියලු ගෙවීම්

ගිණුම් සහ විගණනය.

**9.** (1) අරමුදලේ ආදායම සහ වියදම පිළිබඳව ද වත්කම් හා බැරකම් පිළිබඳව ද වෙනත් ගනුදෙනු පිළිබඳව ද නියි ගිණුම් පොත් තබා ගැනීමට මණ්ඩලය විසින් සැලැස්විය යුතු ය.

(2) අරමුදලේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කළ යුතු ය.

(3) ආදායම් සහ වියදම් ගිණුම් සහ ශේෂ පත්‍රය, තත් කාර්යය සඳහා මණ්ඩලය විසින් යෝජනා සම්මතයක් මගින් සම්මත කරන ලද මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු විසින් අත්සන් කළ යුතු ය.

(4) මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

රීති සෑදීමට මණ්ඩලයට බලය ඇති බව.

**10.** මණ්ඩලයේ බලතල කාර්ය සහ කාර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම කෙරෙහි බලපාන හෝ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික යම් කාරණා සම්බන්ධයෙන් අවශ්‍ය යැයි මණ්ඩලය විසින් සලකනු ලබන රීති මණ්ඩලය විසින් සාදනු ලැබිය හැකි ය.

පනත යටතේ ක්‍රියා සම්බන්ධයෙන් මණ්ඩලයේ සාමාජිකයන්ට ආරක්ෂාව.

**11.** (1) මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පිට සද්භාවයෙන් කරන ලද හෝ කරන ලද්දේ යැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) අරමුදල විසින් හෝ අරමුදලට විරුද්ධව හෝ යම් අධිකරණයක් ඉදිරියේ පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අරමුදල විසින් දරන ලද යම් වියදමක් අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අරමුදලට ගෙවන ලද හෝ අරමුදලට ලැබුණු යම් ගාස්තු අරමුදලට බැර කළ යුතු ය.

(3) යම් සාමාජිකයකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට විරුද්ධව කවර හෝ අධිකරණයක පවරන ලද සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් සම්බන්ධව (1) වන උපවගන්තියේ සඳහන් පරිදි ඒ සාමාජිකයා විසින් දරන ලද යම් වියදමක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත් සහ ඒ වියදම එම සිවිල් නඩුවේදී හෝ අපරාධ නඩුවේදී ඔහු විසින් අය කරගෙන ඇත්නම් මිස, අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයකුට විරුද්ධව පෞද්ගලිකව හෝ ඔහුගේ දේපළට විරුද්ධව රිට් ආඥා නිකුත් නොකළ යුතු බව.

**12.** අරමුදලට විරුද්ධව පවරන ලද නඩුවකදී මණ්ඩලයේ යම් සාමාජිකයකුට විරුද්ධව පෞද්ගලිකව හෝ ඔහුගේ දේපළට විරුද්ධව හෝ කිසිම රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු ය.

13. අරමුදල, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

අරමුදල අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

14. මේ පනතේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස,—

අර්ථ නිරූපණය.

"සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්,—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතිය අනුව පිහිටුවා ඇති වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ සහ ගණකාධිකාරීවරයකු ලෙස වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ තැනැත්තෙක් ; හෝ

(ආ) එක් එක් නේවාසික හවුල්කරු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතිය අනුව පිහිටුවා ඇති වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ සහ ගණකාධිකාරීවරයකු ලෙස වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ගණකාධිකාරී සමාගමක්

අදහස් වේ ;

"දෘශ්‍යාබාධිත" යන්නෙන්, උත්පත්තියෙන් හෝ අන්‍යාකාරය කින් දෑසම සම්පූර්ණ අන්ධභාවයට පත් හෝ සම්පූර්ණ අන්ධභාවයට ආසන්න අන්ධභාවයට පත් තැනැත්තෙක් අදහස් වන අතර දෑසම නොමැති හෝ සම්පූර්ණ අන්ධ භාවයට ආසන්න වූ එක් ඇසක් පමණක් ඇති තැනැත්තෙක් ඊට ඇතුළත් වේ.

15. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.